ලේඛන අංක: ස.සේ. 93-4 සමාජ සේවා දෙපාර්තමේන්තුව

## වැඩිහිටියන් සඳහා සුභ සාධන කටයුතු සැලසීම

01. වයස අවුරුදු 60 ඉක්මවූවන් වැඩිහිටියන් වශයෙන් සලකනු ලැබේ. ජීවත්වීමට නිවාස නැති, රැකබලා ගැනීමට කිසිවෙකුත් නැති හා කිසිවකුගේ ආධාරයක් නොලබන දිළිඳු වැඩිහිටියන්ට රජය මගින් පාලනය වන හෝ රජයේ ආධාර ඇතිව ස්වේච්ඡා සංවිධාන මගින් පාලනය වන වැඩිහිටි නිවාසවල නේවාසික රැකවරණ ලබා ගත හැකිය.

02. වැඩිහිටි නිවාස වර්ග තුනකි.

2:1. රජය මගින් පාලනය වන නිවාස.

මේවායේ සියළු වියදම් රජය විසින් දරනු ඇති අතර, රජයේ සේවක මංඩලයක් මගින් පාලන හා අනිකුත් කටයුතු කෙරේ. මෙවැනි නිවාස තුනක් මිරිගම, අනුරාධපුර, හා කයිතඩි යන ස්ථානවල පිහිටුවා ඇත. එක් නිවාසයක නේවාසිකයන් 250 කට පමණ ඉඩ ඇත.

2:2 රජයේ කුටි නිවාස.

ප්‍රාදේශීය ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතු පාලක මංඩලයක් මගින් පාලනය වන කුටි නිවාසවල උපරිම නේවාසික සංඛ්‍යාව 25 කට සීමා කෙරේ. මෙවැනි කුටි නිවාස 15 ක් දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටුවා ඇත. මේවායේ නේවාසිකයන්ගේ නඩත්තුව සඳහා රජය මගින් මසකට එක් අයෙකුට රු. 110/- ක මුදලක් ගෙවනු ලැබේ. පාලක කමිටුව මගින් අවශ්‍ය අනිකුත් මුදල් ලබා ගැනීම අපේක්ෂා කෙරේ. මීට අමතරව මේවා අලුත්වැඩියා කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා වසරකට රු. 75000/-ක් උපරිමයකට යටත්ව දරණ ලද වියදමින් අඩකට සමාන මුදලක් ගෙවනු ලැබේ. උපකරණ මිළයට ගැනීම සඳහා රු. 40,000/-ක උපරිමයකට යටත්ව දරණ ලද වියදමින් අඩකට සමාන මුදලක් ගෙවනු ලැබේ.

2:3 ස්වේච්ඡා සංවිධාන වලින් පාලනය වන වැඩිහිටි නිවාස.

මෙම නිවාස ඒ ඒ ස්වේච්ඡා සංවිධාන මගින් පාලනය වන අතර, නේවාසිකයන්ගේ නඩත්තුව සඳහා මසකට එක් අයෙකුට රු. 100/- ක මුදලක් ගෙවනු ලැබේ. අවශ්‍ය අනිකුත් වියදම් ස්වේච්ඡා සංවිධානය මගින් සපයා ගැනීම අපේක්ෂා කෙරෙන අතර, ගොඩනැගිලි වැඩිදියුණු කිරීම, හා ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සඳහා වසරකට රු. 75,000/-ක උපරිමයකට යටත්ව දරන ලද වියදමින් අඩකට සමානවූ මුදලක් ගෙවනු ලැබේ. උපකරණ මිළයට ගැනීම සඳහා රු. 40,000/-ක උපරිමයකට යටත්ව දරන ලද වියදමින් අඩකට සමානවූ මුදලක් ගෙවනු ලැබේ. මෙවැනි නිවාස 55 ක් පමණ විවිධ ප්‍රදේශවල ඇත.

2:4 මුදල් ගෙවා නේවාසික පහසුකම් ලබාගත හැකි ස්වේච්ඡා නිවාස..

මෙවැනි නිවාස 10 ක් පමණ ස්වේච්ඡා සංවිධාන මගින් පාලනය වන අතර, මෙම නිවාසවල නේවාසිකයන්ගේ නඩත්තු හෝ වෙනත් කටයුතු වෙනුවෙන් රජයෙන් ආධාර ලබා නොදේ.

2:5 දිවා සුරැකුම් මධ්‍යස්ථාන.

හුදකලාව සිටින දිළිඳු වැඩිහිටියන්ට දවල් කාලය ගත කිරීම සඳහා මෙවැනි මධ්‍යස්ථාන පිහිටුවා ඇත.

03. ආධාර ගෙවීමේ ක්‍රමය.

3:1 ස්වේච්ඡා සංවිධාන මගින් පාලනය වන නිවාසවලට ආධාර ගෙවනු ලබන්නේ පසුගිය වර්ෂයේ කරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීමක් වශයෙනි. මේ සඳහා සමාජ සේවා නිලධාරී විසින් අදාල නිවාසයේ වියදම් පිලිබඳ ලිපිගොනු හා පැමිණීමේ ලේඛණ පරීක්ෂා කිරීමෙන් පසු ඉදිරිපත් කළයුතු වාර්තාව පදනම් කළයුතුය. මෙම වාර්තා එස්.එස්.පී. 15 යන ආකෘති මත සකස් කළයුතු අතර, සමාජ සේවා නිලධාරීන්ගේ නිර්දේශය මත ප්‍රාදේශීය ලේකම් විසින් ගෙවීම් සඳහා අනුමැතිය දිය යුතුය.

04. ආධාර ගණන් බැලීම.

4:1 නඩත්තු ආධාර.

ආයතනයේ මාසික පැමිණීමේ ලේඛණය අනුව එම මාසයේ මුලු පැමිණීමේ සංඛ්‍යාව 30 න් බෙදා ලැබෙන උත්තරය ගෙවිය යුතු ආධාර මුදලින් වැඩි විට එම මාසය තුළ ඉතිරිවන කොටස 15 ට හෝ ඊට වැඩි නම් එම පෙ එකක් සේ සලකා ලැබෙන උත්තරයට එක් කළයුතුය. මේ අනුව මාස 12 සඳහා වෙන්වෙන්ව ගණන් බැලිය යුතුය.

උදාහරණයක් වශයෙන් ජනවාරි මාසයේ නේවාසිකයින් 25 ක් සිටින ආයතනය පැමිණීමේ මුලු එකතුව 618 ක් නම් එම ගණන 30 න් බෙදූ පසු

(618 ÷ 30 = 20 යි ඉතිරි 18 )

ඉතිරිය 18 ක් නිසා එකක් වශයෙන් සැලකූවිට උත්තරය (20 + 1) 21 වේ. ඒ අනුව ආධාර ලැබිය යුතු සංඛ්‍යාව පුද්ගලයන් 21 ක් වශයෙන් සැළකිය යුතුය. එම ගෙවනු ලබන ආධාර මුදලින් වැඩිකළ විට ගෙවිය යුතු ආධාර මුදල ලැබේ. මේ අනුව මාසයෙන් මාසය ගණන් බලා ගෙවිය යුතු ආධාර මුදල කොතෙක්දැයි නිගමනය කළයුතුවේ.

4:2 යථායෝග්‍යාධාර.

ගොඩනැගිලි අලුත් වැඩියා කිරීම්, වැඩිදියුණු කිරීම් ආදිය සඳහා පිළිගත් කාර්මික නිලධාරියෙකු විසින් අනුමත කරන ලද සැලැස්මක් මත ලබා ගන්නා ලද ඇස්තමේන්තු පදනම් කර ගෙන ගෙවීම් පිලිබඳ සලකා බැලිය යුතුය.

එන්.ඩබ්ලිව්.ඊ. විජේවන්ත
සමාජ සේවා අධ්‍යක්ෂ.